ලන්ඩනයේ සිටින

ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා

විසින්

1987 ජූලි මස 12 වැනි දින

ඉන්ටර්කොන්ටිනන්ටල් හෝටලයේදී

පැවැත්වූ පිළිගැනීමේ උත්සවයේදී

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

# ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා

විසින් පවත්වනු ලැබූ කථාව

BKT 0143
26/08/2023

ලන්ඩනයේ සිටින

ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා

විසින්

1987 ජූලි මස 12 වැනි දින

ඉන්ටර්කොන්ටිනන්ටල් හෝටලයේදී

පැවැත්වූ පිළිගැනීමේ උත්සවයේදී

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා

විසින් පවත්වනු ලැබූ කථාව.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**ලන්ඩනයේ සිටින ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා විසින් 1987 ජූලි මස 12 වැනි දින ඉන්ටර්කොන්ටිනන්ටල් හෝටලයේදී පැවැත්වූ පිළිගැනීමේ උත්සවයේදී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් පවත්වනු ලැබූ කථාව.**

අද තමුන්නාන්සේලා සමග එක් වීමට හැකිවීම ගැන ප්‍රේමදාස මහත්මියත් මාත් ඉතාම සන්තෝෂ වෙනවා. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් කියන විවිධ වර්ගවලට අයිති තමුන්නාන්සේලා සියලුදෙනාගෙන්ම ශ්‍රී ලංකා සමාජය නියෝජනය කරනවා. තමුන්නාන්සේලාගෙන් බොහෝ දෙනෙක් එක්සත් රාජධානිය තමන්ගේ අලුත් මව් රට බවට පත් කරගෙන තිබෙනවා. සමහරෙක් මෙහේ තාවකාලිකව ඉඳගෙන එක්කෝ රැකියාවක් කරනවා, නැත්නම් ඉගෙනගන්නවා. තමුන්නාන්සේලා මව් රටින් මෙතරම් ඈත්වෙලා හිටියත් තමුන්නාන්සේලාගේ හදවත් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ බවට මට සැකයක් නැහැ.

තමුන්නාන්සේලා මේ මහා බ්‍රිතාන්‍යයේ සිටින කොට දෙවැනි මව් රටක ඉන්නවා වගෙයි. මම එහෙම කියන්නේ මේ ශ්‍රේෂ්ඨ රටත් සමග අපේ තිබෙන මිතුරු සබඳතා දීර්ඝ කාලයක ඉඳලා පවතින ඒවා නිසයි; ඒ වාගේම ශක්තිමත්, ස්ථිරසාර ඒවා නිසයි. එදිරිවාදුකම් හැටියට තමයි, අපේ සබඳතා මුලින් පටන්ගත්තේ. ඒ විදියේ සබඳකම් පැවතුනේ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය තිබුණු කාලේ. නමුත් කල් යනකොට අපේ රටවල් දෙකට හොඳ අන්‍යොන්‍ය අවබෝධයක් ඇතිකරගන්න පුළුවන් උනා. අපි දෙගොල්ලො එකිනෙකාගේ සමාජ, දේශපාලන, සංස්කෘතික අපේක්ෂාවන් අවබෝධකරගත්තා. මේ අවබෝධයේ ප්‍රතිඵලය

ලෙසට අපේ දෙරට අතර ස්ථිරසාර මිත්‍රත්වයක් ඇති උනා. මේ මිත්‍රත්වය නිසා ශ්‍රී ලංකාව නිදහස දිනාගත්තාට පස්සෙත් පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය ලබාගෙන ඒ මිත්‍ර සබඳකම් තවදුරටත් පබාගන්න ක්‍රියා කළා. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයෙන් උරුම වුණු පාර්ලිමේන්තු ආණ්ඩු-ක්‍රමයක් තබා ගත්තා. නමුත් ඒ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය දැන් අපි වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙසට හැඩගසාගෙන තිබෙනවා. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සබඳකම් පවත්වන එකම මාධ්‍යය හැටියට ඉංග්‍රීසි භාෂාවත් පවතිනවා.

එක්සත් රාජධානියත් මේ අන්‍යෝන්‍ය සබඳකම් ශක්තිමත් කරන්න හැමවිටම ආධාර කළා. නිදහස දිනාගැනීමෙන් පස්සේ මහා බ්‍රිතාන්‍යයේ මහා රාජිනියත් අග්‍රාමාත්‍යතුමාත් ශ්‍රී ලංකාවේදී පිළිගැනීමේ වරප්‍රසාදය අපට ලැබුණා. කඩිනම් මහවැලි යෝජනා ක්‍රමයේ වික්ටෝරියා ජලාශය හැදීමේ වියදම දරා තිබෙන්නේ එක්සත් රාජධානියෙන් ලැබුණු ආධාරවලින්.

ප්‍රිය මිත්‍රවරුනි,

මේ තත්ත්වය නිසා අප දෙරට අතර පවත්නා මිත්‍රත්වය ගැන අපි ආඩම්බර වෙනවා. මේ හොඳ සබඳකම් තවත් දියුණු කර ගන්න-ක්‍රියා කිරීම අපේ යුතුකමක්. ශ්‍රී ලංකාවෙන් ඇවිල්ලා මෙහි සිටින නොමග ගියපු පුද්ගලයින් ටික දෙනෙකුත් ඉන්නවා. අප දෙරට අතර තිබෙන හොඳ සබඳතා විනාශ කරන්න ඔවුන් තැත් කරනවා. නමුත්නාත්දේලා

ටිකක් වහන්සි ගත්තොත් ඔවුන් ගෙන යන දුෂ්ට ව්‍යාපාරය මෙල්ල කරන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ සමගියට සෞවරීගාවයට හොමින අඛණ්ඩත්වයට අනුකූලතාව දැක්වීම ගැන අපි එක්සත් රාජධානියේ රජයට ස්තූතිවන්ත වෙනවා. ශ්‍රී ලංකා මාතාවගේ දූ පුතුන් හැටියට ඇත්තවශයෙන්ම තමුන්නාන්සේලා ඉතාම ආශාවෙන් ඉන්නවා ඇති, දැන් ඇත්තවශයෙන්ම ශ්‍රී ලංකාවේ සිදුවන්නේ කුමක් ද කියා මගෙන් අසා දැනගන්න. සෑම දිනකම වාගේ ලෝකයේ පුවත්පත්වල මුල් පිටුවේම ශ්‍රී ලංකාව ගැන කුතුහලය දනවන පුවත් පළවෙනවා.

ටික කලකට පෙර අපේ රට සාමකාමී, නිස්කලංක රටක් හැටියට පැවැතුන බව තමුන්නාන්සේලා දන්නවා. සෑම වර්ගයකටම සෑම ආගමකටම අයත් ජනයා ඉතාම සමගියෙන් සමාදානයෙන් එහි ජීවත් වුනා. ඔවුන් එකිනෙකා ගැන ආදරයෙන් ගෞරවයෙන් ජීවත් වුනා. ඔවුන් එකිනෙකාගේ දේශපාලන, ආගමික, සංස්කෘතික අනන්‍යතාවට ගරු කළා. මෙන්න මේ වාගේ තත්වයක් තිබෙන කොටයි, ත්‍රස්තවාදයේ අවලක්ෂණ හිස එසවුනේ. ලෝකයේ හැමතැනකම සිටින ත්‍රස්තවාදීන්ගේ හැසිරීමෙන් පැහැදිලිවම පෙනෙන්නට තිබෙන හැටියට සංස්කෘතිය, ආගම, මිනිස් අයිතිවාසිකම් පමණක් නොවෙයි, මිනිස් සමාජය අගය කරන කිසිම උතුම් දේකටවත් ත්‍රස්තවාදීන්ගේ මොනම ගරුසරුවක්වත් නැහැ. ඔවුන් ඇත්තවශයෙන්ම අපරාධකාරයින්, මැරවරයින් මිස වෙන කවුරුවත් නොවේ. මිනිමැරීමෙන් ලැබෙන ආශ්වාදයක් නිසාම ඔවුන් මිනී මරනවා. තමන්

අපිත් මැරුම්කන්නේ කිරිසර්පයින් ද, කාන්තාවන් ද අසරණ කම්කරුවන් ද සිල්වත් පූජකයින් වහන්සේලා ද කියන එක ගැන ඔවුන්ගේ අබමල් රේණුක තරම්වත් හැකිමක් නැහැ. නමුත් පුදුමයට කාරණය ඔවුන් 'අපේ කොල්ලෝ' 'සටන්කාමීන්', 'ගරිල්ලා භටයෝ', 'විමුක්ති භටයෝ' වගේ නම්වලින් හඳුන්වන අය ඉන්නා එකයි. කවුද මේ නම්වලින් ඔවුන් හඳුන්වන්නේ ? කිසිම පුදුමයක් නැහැ - ඔවුන්ට සහයෝගය දෙන අය. මොකද ඒ අය ඔවුන්ට සහයෝගය දෙන්නේ? හේතුව මේකයි - ඒ වෙනුවට ඔවුන්ගෙනුත් සහයෝගය බලාපොරොත්තු වෙනවා. ත්‍රස්තවාදීන්ට සහයෝගය දෙන අයට ආපසු ත්‍රස්තවාදීන්ගේ සහයෝගය අවශ්‍ය වන්නේ ඇයි? ඒක තමයි වැදගත් ප්‍රශ්නය.

ත්‍රස්තවාදය මුළු ලෝකයටම ව්‍යසනයක් වෙච්ච බවට පඬුත්තාන්සේලා එකඟ වෙනවා නිසැකයි. ඒක ප්‍රජාතන්ත්‍රවාදී ලෝකෙටත් ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයටත් එල්ල වෙච්ච තර්ජනයක්. ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු අගය කරන අපි ත්‍රස්තවාදයට ආධාරදීමෙන් සහාය දීමෙන්, ධෛර්ය දීමෙන් වළකින්න ඕන. ජාතික වුනත්, අන්තර්ජාතික වුනත් ත්‍රස්තවාදය විනාශ කර දමන්න ලෝකයේ සියළුම ප්‍රජාතන්ත්‍රවාදී රටවල් සියලු භේද අමතක කරලා අත්වැල් බැඳගන්න ඕන. ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු අගය කරන, මූලික මිනිස් අයිතිවාසිකම් මිනිස් නිදහස අගය කරන සියලුම සාමකාමී ජාතීන් ත්‍රස්තවාදය කියන පොදු සතුරාට විරුද්ධව සටන් කරන්න එක්වෙන්න ඕන. මේ කටයුත්ත සඳහා ගන්නා පළමු පියවරක්

හැටියට සංවර්ධනය වෙච්ච රටවල් ත්‍රස්තවාදීන්ට අවි ආයුධ විකිණීම නවත්වන්න ඕන. ත්‍රස්තවාදීන්ගේ ව්‍යාපාර ගැන ඔවුන්ට මුදල්, අවි ආයුධ ආදිය ලැබෙන මාර්ග ගැන ඔවුන් පරීක්ෂාවෙන් ඉන්න ඕන. ශ්‍රී ලංකාව වගේ පුංචි රටවලට ජාත්‍යන්තර ආධාර නැතිව ත්‍රස්තවාදය වැඩපවත්වන්න දුෂ්කර නිසා මේ සඳහා ජාත්‍යන්තර අරමුදලක් පිහිටුවන්න ඕන.

ශ්‍රී ලංකාව 1977 පටන් සිද්ධ ආර්ථික සංවර්ධනයක් ලබා තිබෙනවා. අපේ ආර්ථිකය අපි ලිහිල් කළා. ඒක නිසා විදේශීය ආයෝජකයෝ ලහි ලහියේ අපේ රටේ ධනය ආයෝජනය කරන්න පටන් ගත්තා. විවිධ කර්මාන්ත රැසක් අපේ රටේ ආරම්භ කළා. මේ හේතුවෙන් අපේ රටේ එක් එක් පුද්ගලයාට වැටෙන සාමාන්‍ය ආදායම සංවර්ධනය වෙන්න නැත් කරන බොහොමයක් රටවල ප්‍රමාණයට වඩා හුඟක් වැඩි මට්ටමකට නැංගා. එන්න එන්නම රක්ෂාවල් සැපයීම් වැඩිවුණා. අපි මහවැලි ගඟත්, තවත් ගංගා කිහිපයකුත් සංවර්ධනය කරන්න පටන් ගත්තා.

අපේ රට ප්‍රධාන ආහාර වර්ගවලින් ස්වයංපෝෂිත තත්ත්වයට ලංවෙන්න පටන් ගත්තා. අපි අපේ අවශ්‍යතාවන්ට පිරිමහින ප්‍රමාණයේ ජලවිදුලිබලය ඉක්මනින් නිෂ්පාදනය කරන්න පටන් ගත්තා. අපි කෘෂිකර්ම කටයුතුවලටත්, ජනාවාස පිහිටුවන්නත් අළුත් බිම් පෙදෙස් ප්‍රයෝජනයට ගන්න පටන් ගත්තා.

අපි ඉතාම විශාල නිවාස සම්පාදන වැඩසටහනකුත් ඇරඹුවා. පවුල් ලක්ෂයකට නිවාස හදාදීමෙන් පස්සේ තවත් නිවාස දස ලක්ෂයක් හදන වැඩසටහනක් දියත් කරලා දැන් ඒ අරමුණත් දිනාගන්න වේගයෙන් ඉදිරියට යනවා. අපේ ජනතාවගේ සිත් තුළට ආරක්ෂාව පිළිබඳ හැඟීමක් තෘප්තියක් පිවිසෙන්න පටන්ගත්තා. අපි දිගින් දිගටම අනුගමනය කළේ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්.

ඉතින් මේ සියල්ල ගැන ඊර්ෂ්‍යා කරන අයත් ඇතිවෙන්න පටන් ගත්තා. ඔවුන්ට අපේ විදේශ ප්‍රතිපත්තිය නොරිස්සුමට කෝපයට කරුණක් උනා. ඇතැම් අය හිතුවා, අපි ඔවුන් හැම තිස්සේම අනුගමනය කරන එහෙයියෝ වෙන්න ඕනෙයි කියල. අපේ ආර්ථික සංවර්ධනය ඔවුන්ගේ ඊර්ෂ්‍යාවට හේතු වුණා. අපේ දේශපාලන ස්ථාවරත්වයත් ඔවුන්ගේ අසහනයට හේතු වුනා. මේකට ඔවුන්ගෙන් ඇතිවෙච්ච ප්‍රතික්‍රියාව දැන් බොහොම පැහැදිලියි. ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වය බිඳ දමන්න ඔවුන් තීරණය කළා.

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය මම තමුන්නාන්සේලාට අවධාරණයෙන් කියන්න ඕන, ඉන්දියාවේ විශේෂයෙන්ම තමිල්නාඩු ප්‍රාන්තයේ කවල පොවල හදන වඩන එකක්. මේ අළුතක් වනතුරුම ඉන්දියාව මේක නැතෙයි කිව්ව; තමන්ගේ රටේම පුවත්පත්වලින් ඒක එළිදරව් කරන කොටත් ඔවුන් නැතෙයි

කිව්වා. නමුත් පස්සේ, ශ්‍රී ලංකාවෙන් පැනලා ගිය ත්‍රස්තවාදී නායකයින් ඉන්දියානු බිමේ ඉඳගෙන කරන බලපුළුවන් කාරකම් පිළිගත්ත ඉන්දියාවට සිද්ධ වුණා. ඉන්දියානු බලධාරීන් ඔවුන් නිල වශයෙන්ම සාකච්ඡාවලට කැඳෙව්වා. ඒ වාගේම ඉන්දියාව ඔවුන්ගෙන් සමහර දෙනෙක් ඔවුන්ගේ තුවක්කු මෝටාර් වෙඩි ආදියත් එක්කම තාවකාලික අත්අඩංගුවට ගත්තා. ඊට අමතරව, ත්‍රස්තවාදීන්ම ප්‍රකාශ කරලා තිබෙනවා තමන් 'දරුකමට හදාවඩා ගත්ත අම්මා' ඉන්දියාව බව. මේ සම්බන්ධතාවය හොඳටම ඔප්පු කරමින් තමිල්නාඩු මහ ඇමති 'එල්ටීටීඊ' සංවිධානයට ඉන්දියානු රුපියල් දසලක්ෂ 30 ක මුදල් පරිත්‍යාගයක් කළා. 'එල්ටීටීඊ' තමයි ප්‍රධාන ශ්‍රී ලාංකික ත්‍රස්ත කණ්ඩායම.

ප්‍රිය මිත්‍රවරුනි,

ශ්‍රී ලංකාවේ කවදාවත් මිනිස්සුන්ට කන්න බොන්න නැතිවන සාගතයක් ඇතිවුනේ නැහැ. මතක ඇති කාලෙක එහෙම තත්ත්වයක් ඇතිවුනේ නැහැ. යාපනේ ප්‍රදේශයේ ආහාර හිඟයක් ඇතිවුනායි කියලා තමුන්නාන්සේලාට කවදාවත් අහන්න ලැබුණාද? ත්‍රස්තවාදීන් කොච්චර බාධා පැමිණෙව්වත් අපේ ආණ්ඩුව උතුරේත් නැගෙනහිරෙත් ජනයාට ආහාර ඖෂධ වගේම අනිකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සියල්ලක්ම අඩුවක් නො මැතිව දිගටම සැපයුවා. මේ අලුතදි යාපන අර්ධද්වීපයට ඉන්ධන සැපයීම සීමාකළේ ත්‍රස්තවාදී ක්‍රියාවලට පමුණුවන බාධාවක් හැටියටයි. යාපනේ සාමාන්‍ය පුරවැසියන්ට ඔවුන්ට ගෙදරදොරේ පාවිච්චියට අවශ්‍ය භූමිතෙල්

සැපයුවා. පොදු ප්‍රවාහන කටයුතුවලට අවශ්‍ය ඉන්ධන සීමාකරන්නේ නැතිව සැපයුවා. කොහොමටවත් පැට්‍රෝල් , ඩීසල්, භූමිතෙල් කියන මේවා ආහාර හැටියට හඳුන්වන්න බැහැනේ නේද? නමුත් අගතියට පත්වෙච්ච හිතකට නම් එහෙමත් පේන්න පුළුවන්.

ඉතින්, මිත්‍රවරුනි,

ඔය විදියට අන්තිමට ගුවනින් ආහාර පාර්සල් ගෙනැවිත් දැම්මතුත් සිද්ධ වුණා. ඒක ශ්‍රී ලංකා ගුවන් සීමාව අමු අමුවේම උල්ලංඝනය කිරීමක්. කවුද මේක කෙරුවෙ? ඉන්දියානු ආණ්ඩුව. දැන් මුළු ලෝකෙම මෙන්න මේ ප්‍රශ්නය අහනවා: ඍග්වේදයෙන් පෝෂණය වුණු මේ ශ්‍රේෂ්ඨ සංස්කෘතියෙන් අසල්වැසියන් විනාශ කිරීමට මානබලන බලකාමී ප්‍රතිපත්තියක් බිහිවුනේ කොහොමද? මහත්මා ගාන්ධිතුමාගේ අහිංසා ප්‍රතිපත්තියට මොකද වුනේ? තාගෝර්තුමා ගේ සාමයේ දර්ශනය කෝ? ජවහර්ලාල් නේරුතුමාගේ උදාරත්වය කෝ? අනේ .... මේ ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ දයාදයට උරුමක්කාරයන් හැටියට ඉන්න අය තෝරාගෙන තිබෙන මගක හැටි!

ඉන්දියාව විසින් කරපු ඒ බලහත්කාරකම ගැන ලොව පුවත්පත් පළ කළ ඉතාම සෘජු පැහැදිලි විවේචන තමුන්නාන්සේලා කියවන්න ඇති. ඇත්තවශයෙන්ම සිද්ධ වූ දේ මම තමුන්නාන්සේලාට කියන්නම් ... යාපනේ මිනිස්සු නිරාහාරයෙන් ඉන්නව යි කියලා ඉන්දියානු රජය හදිසියේ ම තීරණය කළා. දස ලක්ෂ ගණන් ජනයා නිරාහාරයෙන් ඉන්නේ තමන්ගේම රටේ බව ඔවුන් මොහොතකට අමතක කළා. හොඳට කාල බීලා ඉන්න

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

යාපනේ ජනයාට බලෙන් කෑම කවන්න ඉන්දියානු ආණ්ඩුව තීරණය කළා. මෙහෙම තීරණය කරලා 1987 ජුනි මාසයේ 3 වැනි දා යාපනේට ආහාර නැව් එවන බව ඉන්දියානු ආණ්ඩුව ජුනි 01 වැනි දා ශ්‍රී ලංකා ආණ්ඩුවට දැන්නුවා. මේ ආහාර බෙදීමට උදව් කරන්න කියලා ඔවුන් ශ්‍රී ලංකාණ්ඩුවෙන් ඉල්ලුවා. ඊට උත්තර සපයමින් අපි දැන්නුවා, අපට අවශ්‍ය තරම් ආහාර තිබෙන නිසා අපට ඉන්දියාවෙන් ආහාර අවශ්‍ය නැත; නමුත් අපට කොහොමහරි ආහාර තොග එවිය යුතුමයි කියන තරමට ඉන්දියාව පරිත්‍යාගශීලී වෙනවා නම්, ඒ ගැන වැඩපිළිවෙල යොදාගන්න අපේ නිලධාරීන් සමග සාකච්ඡා කරන්න පුළුවන් කියා.

හැඩිදැඩි චණ්ඩියෙක් පුංචි ළමයෙකුට බතිස් ගෙඩියක් බලෙන් ගිල්ලවන්න මහන්සිගන්න කොට ඔහු පුංචි ළමයා එක්ක ඒ ගැන කාරිය පරිපාටියක් සාකච්ඡා කරයි කියලා හිතන්න බැහැ නේද? එලෙසින්ම ඉන්දියාව ජුනි 3 වැනි දා ආහාර බෝට්ටු සමූහයක් එව්වා. අපේ නාවික හමුදාව ඒ බෝට්ටු අපේ මුහුදු සීමාවට ඇතුල්වීම වැළැක්වුවා. ඉතින් මේ බෝට්ටුවලට ආපසු යන්න වුණා. චණ්ඩියට හිතුනා තමන්ට වුනේ මදි පුංචිකමක් කියලා. ඊට පසුදාම ඉන්දියාවේ සිටින අපේ මහ කොමසාරිස්වරයාට යන්තම් පැයක් තියා දැනුම් දීලා ඉන්දියානු ගුවන් හමුදාවේ අහස් යානා මිරාජ් 2000 යුධ ගුවන් යානාත් පිරිවරාගෙන ඇවිල්ලා ආහාර ටොන් 22 ත් 23 ත් අතර ප්‍රමාණයක් පැරෂුට් ආධාරයෙන් ශ්‍රී ලංකා භූමියට හෙළුවා. ඒක ඇත්තවශයෙන්ම විලිලජ්ජා නැති ආක්‍රමණයක්.

මේ ක්‍රියාව මුළු ලොවටම කම්පනයක්, පුදුමයක් වුණා. ඉන්දියාව මේ ක්‍රියාවෙන් ත්‍රස්තවාදයට වඩාත් එළිපිට සහයෝගය ලබා දෙන ආකාරයේ පින්තූරයක් මවා පෑවේ නැත්ද?

ඉන්දියානු ආණ්ඩුවේ මේ බලහත්කාර ක්‍රියාව ගැන තවුන්තාන්ජේලා හමුවේ මට කරන්නට පුළුවන් හොඳම විවේචනය ඉන්දියානු පුවත්පත්ම ඒ ගැන කිව්ව දේ තවුන්තාන්ජේලා ඉදිරියේ තැබීම කියල යි මට හිතෙන්නේ.

> ''ඔන්ලුකර්' කියන සඟරාවේ 1987 ජුනි 16-30 කලාපයේ මෙසේ කියා තිබුණා. 'දැන් අත්තිමේ දී කඩතුරාව ඉවත්ව ගොස් ඇත. ඉන්දියාව ශ්‍රී ලංකා ප්‍රශ්නය සම්බන්ධයෙන් බේරුම්කරුවෙකු ලෙස තමන්ම ප්‍රකාශ කරගෙන සිටි තත්ත්වයෙන් දැන් ඉවත් වී පැත්තක් වෙනුවෙන් ක්‍රියා කරන ප්‍රධාන පුද්ගලයා බවට පත්ව සිටී.'

1987 ජුනි මස 14 වන දින 'නිවුස් රිපෝතර්' සඟරාවට ලියන ජී.එස්.පිඞිං මෙසේ ප්‍රකාශ කරනවා.

> 'බෙදුම්වාදී යුද්ධය නිසා ද්‍රවිඩ සාමාන්‍ය වැසියනට පීඩාවන්ට මුහුණදීමට සිදුව ඇති නමුත් යාපනය අර්ධද්වීපයෙහි වග විභාගයක් නොමැතිව බෝම්බ දමනැ යි හා හාමත තදින් පැතිරී ඇතැ යි ඉන්දියාව කරන චෝදනා බෙහෙවින් අතිශයෝක්තියට නගන ලද ඒවා බව පෙනෙන්නට තිබේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

එහෙයින් තමන්ට වැදගත් වෙනත් හේතූන් නිසා මෙම පියවර ගන්නා ලදැයි සැක කළ හැකිය. මෙම හේතු මොනවාද කියා අපට සිතාගන්න පුළුවනි.

රට තුළින්ම එල්ලවන දේශපාලන බලපෑම්, ප්‍රධාන වශයෙන්ම බලසම්පන්න ඉන්දියානු ද්‍රවිඩ ප්‍රචාරක කල්ලියෙන් කෙරෙන බලපෑම එක් වැදගත් හේතුවක් විය හැකිය.

කෙසේ වුවද ශ්‍රී ලංකාවට යම් පමණකට විශ්වාසය තැබිය හැකි ශක්තියෙන් යුත් ආරක්ෂා විධිවිධාන තිබිණි නම්, ඉන්දියානුන්ට ඔය තරම් පහසුවෙන් බේරී එන්නට හැකි වන්නේ නැත.'

''ඉන්ඩියන් එක්ස්ප්‍රස්'' පුවත්පතේ හිටපු සංස්කාරකයෙකු වන මුල් ගවෝකාර් විසින් ලියපු ලිපියක් ඒ පුවත්පතේ මැද පිටුවේ පළ කර තිබුණා. මේ ලිපියේ ඉන්දියානු විදේශ ප්‍රතිපත්ති විස්තර කර තිබුණේ ඉන්දියාව දකුණු ආසියාවේ මහා බලය හැටියට, පිළිගන්නා තුරු, නොඉවසිල්ලෙන් සිටින බාලාපරාධකාරයින් විසින් ගෙනයන එකක් හැටියට යි. ඔහු මෙහෙම කියනවා.

'ඉන්දියාවේ පුංචි අසල්වැසියා වන ශ්‍රී ලංකාව නැති ගන්වන පියවරක් අරගෙන තමන්ගේ කීර්තිය ගොඩනගාගන්නට ඉන්දියානු අගමැති රජිව් ගාන්ධිට සිදු වී ඇත. නමුත්, එයින් අවට ප්‍රදේශයේ උද්ගතවන එම ක්‍රියාවේ ප්‍රතිවිපාක ගැන ඔහු සිතා

බලා නැත.'

"ද හරන්ට්" නම් ඉන්දියානු සඟරාවේ 1987 ජුනි 20 වන දින කලාපයේ පළවුණු විස්තරාත්මක ලිපියක මෙන්න මෙහෙම සඳහන් වෙනවා. මේ සඟරාව සුප්‍රසිද්ධ පුවත්පත් කලාවේදියෙකුත් ලේඛකයෙකුත් වූ ඩී.එෆ්.ජ්. කරකා විසින් අරඹන ලද සති පතා සඟරාවක් බවත් මෙහි දී මම සඳහන් කරන්න සතුටු යි.

'..... මෑත දී ශ්‍රී ලංකාවේ ගොවිරි බවත් ගුවන් සීමාවත් උල්ලංඝනය කිරීමෙන් පසු ඉන්දියානුවන් දැන් සිටින්නේ ලජ්ජාවෙන් කරබාගෙන ය...... ඉන්දියාව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉන්දියානු ප්‍රතිපත්තියක් අනුගමනය කරනු වෙනුවට ද්‍රවිඩ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඉදිරිපත් ව සිටි.

'බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට තමිල්නාඩු ප්‍රාන්ත රාජ්‍යයෙන් ලැබෙන අනුග්‍රහය නොවන්නට ශ්‍රී ලංකාවේ යුද්ධමය තත්ත්වය මෙතරම් දරුණු නොවනු හිතැකය.

'(ඉන්දියානු) විදේශ කටයුතු කාර්යාලය දැන් පවත්වාගෙන යනු ලබන්නේ බහුබූතයින් හා නවටයින් විසිනි..... '

' සැම පැත්තකින්ම තිබෙන්නේ වේදනාව බලාපොරොත්තු කඩවීම

හා පිළිකුලයි. තම ආරක්ෂාව සළසාගැනීමට තරම් වත ශක්තියක් නොමැති පුංචි අසල්වැසි රටක ස්වෛරී භාවය උල්ලංඝනය කිරීමෙන් පමණක් ශක්තිය පෙන්විය හැකි රටක තත්ත්වයට ද අප වැටී සිටින්නේ?'

මේ වාගේ ප්‍රකාශ තවත් උපුටා දක්වන්න පුළුවන්. නමුත්, මේ ලජ්ජා සහගත සිද්ධිය ගැන ඉන්දියානු මහජන මතය මොනවාගේ ද යන්න සිතා ගැනීමට මම උපුටා දක්වපු වාර්තා ප්‍රමාණවත් කියා මා හිතනවා.

මේ සිද්ධිය ගැන පළමුවෙන් දැනගන්නට ලැබුණු වෙලාවේ මගේ මේ ශ්‍රී ලාංකික මිතුරන්ට තුමක් හිතෙන්න ඇද්ද කියා මට සිතා ගන්න පුළුවන්. මේ සිද්ධිය ගැන නියම තත්ත්වය හෙළිකරන්න අපට උදව්වීම නමුත්නාන්සේලාගේ යුතුකමක්.

නමුත්නාන්සේලා දන්නවා වාගේම ශ්‍රී ලංකාවේ කොයිම්බකවත් භාෂාවමක් නැහැ. සෑම වර්ගයකම ජනයා ආදරයෙන් සමගියෙන් ජීවත් වෙනවා. උතුරේත් නැගෙනහිරේත් විතර යි ද්‍රවිඩ ත්‍රස්තවාදීන් අනෙක් වර්ගවල ජනයා ජීවත්වීම ඉවසන්නේ නැතිව, ඔවුන්ට හිංසා පීඩා කරන්න පටන් ගෙන තිබෙන්නේ. තමන්ගේ වර්ගයටම වුවත් අයිති අහිංසක මධ්‍යස්ථ මතධාරී මිනිසුන්ට ඉන්න දෙන්න ඔවුන් සූදානම් නැහැ. ද්‍රවිඩ ජනයාගෙන් වැඩි කොටස ජීවත්වන්නේ යාපනයේ අර්ධද්වීපයේ නොවෙයි; වැඩි ජනතාව වන සිංහලයින් වසන ප්‍රදේශවල. නමුත්නාන්සේලා මේ වැදගත් කරුණ මනස තබාගෙන තමන්ගේ මිතුරන්ටත්

දන්වන්න කියා මා ඉල්ලා සිටිනවා. සිංහල, මුස්ලිම් ජන කොටස්වල ආධාරයත් ආරක්ෂාවත් ලබා ඔවුන් හොඳින් ජීවත් වෙනවා.

කලින් ඇමෙරිකානු යුද්ධ රහස් තොරතුරු විශ්ලේෂකයෙකු හැටියට ක්‍රියා කළ හවායි විශ්ව විද්‍යාලයේ ජේමස් ඒ මාර්කස් මහතා අපේ ත්‍රස්තවාදී ප්‍රශ්නයට ඉන්දියාවේ සම්බන්ධය ගැන ඔහුගේ නිරීක්ෂණයක් පළකර තිබෙනවා. මෙන්න ඔහු කියපු දේ:-

> '1986 හා 1987 යන වර්ෂවල ත්‍රස්තවාදීන්ට විරුද්ධව ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ඒකාබද්ධ ක්‍රියා මාර්ගයක් ගන්නට තැත් කළ සෑම අවස්ථාවකම ඉන්දියාව මැදිහත් වී එම ප්‍රහාර අඩුකරලීමට කොළඹ රජයට බලකරන ලදි.'

> 'නමුත් ඉන්දියානු මැදිහත්වීම නිසා සිදුව තිබෙන්නේ ගැටුමට අදාළ ප්‍රධාන පාර්ශවයන්ට අනුන්ගේ ඇඟිලි ගැසීමක් නොමැතිව සාපේක්ෂ වශයෙන් නිදහසේ සිට තම තමන්ගේ ශක්තිය අනුව ක්‍රියා කිරීමට ඉඩ දෙන ලද නම්, උද්ගතවන්නට ඉඩ තිබුණු තත්ත්වයට වඩා බෙහෙවින් නරක තත්ත්වයක් උද්ගතවීම බව පැහැදිලි ය.'

ගුවනින් ආහාර හෙලිමෙන් කරපු ක්‍රියාව යුක්ති සහගත යි කියා පෙන්වන්න ඉන්දියාව නොයෙක් හේතු පෙන්නා තිබෙනවා. ගුවනින් ආහාර

හෙළිම කලේ ශ්‍රී ලංකාව ගරු සරුවක් නැතිව දොඩන නිසා යැයි කියා තිබෙනවා. නමුත් මුළු ලෝකයම දන්නවා ශ්‍රී ලංකාව දේශපාලන විසඳුමක් ඇති කර ගන්න ඉතා ම ඕනෑකමින් ක්‍රියා කරපු බව. ඇත්තවශයෙන් වෙන මොනම ආණ්ඩුවක්වත් කරන්නේ නැති තරමේ පරිත්‍යාග කරන්න අපි ඉදිරිපත් වෙලා තිබෙනවා.

අන්තිමේදී යුද්ධයෙන් ප්‍රශ්නය විසඳන්න හිතාගෙන ශ්‍රී ලංකාව උපායෙන් කාලය ලබාගන්න වැඩ කර තිබෙනවා යි කියා තිබෙනවා. නමුත් ඇත්තවශයෙන්ම සිදුවෙලා තිබෙන්නේ මොකක් ද? අපේ ආරක්ෂක හමුදාවන් එක්ක ගැටිලා ත්‍රස්තවාදීන්ට පරාජය අත්වේගෙන යන සැම අවස්ථාවකම නොයෙක් ව්‍යාජ හේතු ඉදිරිපත් කරගෙන ශ්‍රී ලංකාවට බලපෑම් කිරීමෙන් ඉන්දියාව ත්‍රස්තවාදීන්ට කාලය ලබා දීලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ රජය ඒකාධිපති රජයක් නොවෙයි. අපේ මහජනතාවට සැම ප්‍රජාතන්ත්‍රවාදී නිදහසක් ම තිබෙනවා. මේ අවුරුද්දේ අගෝස්තු 15 වැනිදා ට අපේ පළාත් පාලන මැතිවරණ පවත්වනවා. දැන් ඒවාට නාමයෝජනා භාරගෙන තිබෙනවා. පුද්ගලයින්ට නිදහසේ පිටරටවල ගමන් කරන්න පුළුවන් නිදහස කලකට ඉස්සෙල්ලා සීමාකර තිබුණා. අපි හුන්තිවිදින මූලික අයිතිවාසිකම් අපි ඉතාම ඕනෑකමින් ආරක්ෂා කරනවා. අපේ රටේ නැවතත් සාමය, සමගිය, සහෝදරත්වය ගොඩනගාගන්න අපි අවංකව ක්‍රියාකරගෙන යනවා. ප්‍රශ්නය, දේශපාලන ප්‍රශ්නයක් නම්, ඒකට දේශපාලන විසඳුමක් ඇති කර ගන්න අපි සතුටුයි. නමුත්, සටන් උසුසුම ඕනෑකමින්ම

වැඩිකරන කොට, ප්‍රචණ්ඩ ක්‍රියා කරන විට, ඉමක් කොනක් නැති විනාශ කිරීම් කරන විට දේශපාලන විසඳුමකට පියවර ගන්න බැහැ.

අපේ පාර්ලිමේන්තු කණ්ඩායම සම්මත කර ගෙන තිබෙන ප්‍රතිපත්තිය ඒකයි. මේ ජුනි 10 වෙනිදා ඒඑෆ්පී ඒජන්සි නවදිල්ලි ප්‍රවෘත්ති වාර්තාවක් උපුටා දක්වමින් ලෝකයේ ප්‍රවෘත්ති පත්‍රවල වාර්තා වුන අන්දමට ඉන්දිය අග්‍රාමාත්‍ය රජිව් ගාන්ධි මහතා මෙන්න මෙහෙම කියනවා. 'සිත් සටන්කාමීන් සටන් කිරීමත්, මිනිසුන් මැරීමත් නවත්වනතුරු කිසිම ආකාරයක සාකච්ඡාවක් කරන්න පුළුවන් කමක් නැහැ. මේ ලේ හලන ප්‍රචණ්ඩ ක්‍රියා පළමුවෙන් නවත්වන්න ඕනෑ.' එතුමා මෙහෙම කියල තිබෙන්නේ මේ නොබෝදා ත්‍රස්තයන් විසින් ඉන්දියාවේ පන්ජාබ් හරියානා ප්‍රාන්තවල හින්දූන් 72 ක් ඝාතනය කළාට පස්සේ. මෙයින් කමුන්නාන්සේලාට පෙනෙනවා ඇති ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අනුගමනය කරන ප්‍රතිපත්තියේ වෙනසක් නැති බව. නමුත් ප්‍රශ්නය වී ඇත්තේ ඉන්දියාව දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි. ඔවුන් තමන්ගේ ත්‍රස්තවාදී ප්‍රශ්නය සම්බන්ධයෙන් එකම මිම්මක් පාවිච්චි කරන ගමන් අපේ ත්‍රස්තවාදී ප්‍රශ්නය සම්බන්ධයෙන් ඊට හාත්පසින්ම වෙනස් මිම්මක් පාවිච්චි කරනවා. කොහොම වුවත් ඉන්දියානු රජයට මේ ගැන තියම තත්ත්වය අවබෝධ වෙතියි බලාපොරොත්තු වෙනවා.

විදේශීය ධන ආයෝජනයට අපි අපේ රටේ ආර්ථිකය විවෘත කර තිබෙනවා. ආයෝජනය කරන අයට තමන්ගේ මූලධනය, ලාභ

රටින් පිට ගෙනයන්න පුළුවන්. තමුන්නාන්සේලා කරන ආයෝජනවල ආරක්ෂාව, ලාභදායි පැවැත්ම සහතික කර තිබුණා. තමුන්නාන්සේලාට ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකාවට ආපසු ඇවිල්ලා රටට සේවය කරන ගමන් තමන්ගේ යහපත සළසා ගන්නත් පුළුවන්. නිවාස අයිතියට උපරිම සීමාවල් දමලා නැහැ. ඉඩම්වල උපරිම අයිතියත් අක්කර 100 දක්වා අපි වැඩි කර තිබෙනවා.

ප්‍රිය මිත්‍රවරුනි,

තමුන්නාන්සේලාට අභිමානවත්, අගනා උරුමයක් තිබෙනවා. ඒ උරුමය අවුරුදු 2500 කට වැඩි ඉතිහාසයක් තිබෙන එකක්. තමුන්නාන්සේලා-ගේ මුතුන්මිත්තෝ මහා ධෛර්යයක් තිබුණු, දේශාභිමානයෙන් ඔදවැඩුණු ස්ත්‍රී පුරුෂයෝ. තමුන්නාන්සේලාගේ දූ දරුවන්ටත් ඒ ගැන දැනගන්න සළස්වන්න.

තමුන්නාන්සේලාගේ මග පෙන්වම, දැනුම, ආධාරය, ශ්‍රී ලංකාවට අවශ්‍යයි. ආත්මාර්ථකාමි පුද්ගලයින්ට තමුන්නාන්සේලාගේ මව් රටේ හොඳ නම කිලිටි කරන්න ඉඩ නොතබන්නට කරුණාකර වගබලා ගන්න. තමුන්නාන්සේලා අවස්ථාවෝචිත ධෛර්යයෙන් ක්‍රියා කරනවා මට නිසැකයි. ත්‍රස්තවාදීන්ගෙන් විපතට පත් අයට ආධාර කරන්න කැමැති අය එසේ කරනවා නම්, අපි බොහොම සතුටුයි. අපේ නිදහස, ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩත්වය රකින්න ආත්ම පරිත්‍යාගයෙහි යෙදුණු අයට ආධාර

කරන්න මම ත්‍රස්ත විපත් අරමුදල පිහිටුවා තිබෙනවා.

ශ්‍රී ලංකා ජනතාව අපේ රජය කෙරේ තබා තියෙන විශ්වාසය අපි කිසිම දවසක පැහැර හරින්නේ නැහැ. ශ්‍රී ලංකාවේ එක්සත් බවත් ස්වෛරී බවත් භෞමික අඛණ්ඩතාවත් ආරක්ෂා කරන්න අපි හැම උත්සාහයක්ම දරනව.

මගේ කථාව අවසන් කිරීමට කලින් අද මෙතැනට පැමිණීම ගැනත්, මට සාවධානව අසා සිටීම ගැනත් මම තමුන්නාන්සේලාට ස්තූති කරනවා. අපට තමුන්නාන්සේලා අද මුණගැහෙන්න මේ අවස්ථාව සළසා දීම ගැන එක්සත් රාජධානියේ අපේ මහ කොමසාරිස්තුමාටත් මම ස්තූති කරනවා.

ස්තූතියි.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023